

## මොහාන් සමරණායක

# බන්දුන් සමුළුව හරහා

## නොබැඳි ව්‍යාපාරයට පණ පෙවීම

කෙසේ වෙතත් 80 දශකයේ මැද භාගයෙන් පස්සෙ ලෝකයේ බල කඳවුරු බිඳ වැටීමත් එක්ක නොබැඳි ව්‍යාපාරයට කරන්න පුළුවන් බලපෑම සීමාසහිත වෙනව. එය දුබල වී යනව. මෙයට හොඳම උදාහරණයක් තමයි 2003 මාර්තු මාසෙ ඇමෙරිකාව ඉරාකය ආක්‍රමණය කරන්න ඉස්සර වෙලා පෙබරවාරි මාසෙ මැලේසියාවේ ක්වාලාලම්පූර් නුවරදී නොබැඳි ජාතීන්ට අයත් රටවල් 116ම රැස් වෙනව. එහිදී ඔවුන් පොදු යෝජනාවක් සම්මත කරගන්නව ඉරාකයට පහර නොදෙන ලෙස ඇමෙරිකාවෙ-න් ඉල්ලා සිටීමට. එහෙත් ඔවුන්ගේ එම යෝජනාව ඇමෙරිකාව තුට්ටුවකටවත් මායිම් කරන්නෙ නෑ.

අප්‍රේල් මස 18 සිට 22 දක්වා ඉන්දුනීසියාවේ බන්දුන් නගරයේ පැවති ආසියා අප්‍රිකා සහයෝගිතා සමුළුව නොබැඳි ව්‍යාපාරයේ වලංගුභාවය පිළිබඳව නැවත වතාවක් විශේෂ කතාබහක් කරළියට රැගෙන ආවා. ඇත්තටම මෙවර බන්දුන් සමුළුව පැවැත්වුණේ එහි ප්‍රථම සමුළුව පැවැත්වී වසර 50කට පසුවයි. 1955 අප්‍රේල් මස 18 සිට 22 දක්වා තමයි ආසියා අප්‍රිකා පළමු සහයෝගීතා සමුළුව බන්දුන් නගරයේදී පැවැත්වුණේ.

මේ සමුළුව ලෝක දේශපාලනය තුළ විශේෂ වැදගත්කමක් හිමිකර ගන්නව. ඊට ප්‍රධානම හේතුව තමා නොබැඳි ව්‍යාපාරයේ කලලය පිළිසිඳ ගැනීම සිදුවුණේ මෙම සමුළුවේ දී වීම. මෙම සමුළුවේ දී පදනම සැකසුණාට පසුව එහිදී ඇතිවූ යම්යම් ප්‍රතිඵල මත 1961 දී කයිරෝ නගරයේදී නොබැඳි ව්‍යාපාරයේ පළමුවෙන රාජ්‍ය නායක සමුළුව පැවැත්වෙනව.

කොහොම වුණත් අද වන විට නොබැඳි ව්‍යාපාරයේ පැවැත්ම පිළිබඳව එහි වලංගුභාවය පිළිබඳව බරපතල ප්‍රශ්න මතුවෙනව. එයට හේතුව වෙලා තියෙන්නෙ වර්තමාන ලෝක සන්දර්භය තුළ පවතින සමාජ ආර්ථික වටපිටාව තුළ එයට කොතරම් දේවල් කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නකාරී වාතාවරණය නිසයි.

අපිට මෙතනදි ඉතිහාසයට යොමුවෙන්න වෙනව. පහලොස්වන හා දහසයවන සියවස්වල සිට විසිවන සියවසේ මැද භාගය තෙක් ලෝකය සකස් වී තිබුණේ අධිරාජ්‍යවාදීන් අතලොස්සක් විසින් සමස්ථ ලෝකයම පාලනය කරන ආකාරයකටයි. යුරෝපයේ රටවල් මුළු ලෝකයම යටත් කර ගත්ත. ඔවුන් ඉතාමත් සහසික විදියට වංචාකාරී විදිහට ලෝකය පාලනය කළා. ඔවුන්ගේ සංස්කෘතිය ආගම ආදියට මුවාවෙලා ලෝකයේ බහුතර රටවල් සූරාකෑව. මෙම තත්වය පහසු කර ගන්න ඔවුන් එම රටවල්වල තමන්ට හිතවත් පන්තියක් නිර්මාණය කර ගත්ත.

කොහොම වුණත් දහනවවන සියවසේ අග භාගයේ හා විසිවන සියවසේ මුල් භාගයේ දී මෙම යටත්විජිත පුරා නිදහස් අරගල මතුවී වර්ධනය වීමක් සිදුවුණා. මෙය ලෝකයේ සිදුවුණේ විවිධ අන්දමට. එක්එක් රටවල්වල දි එක් එක් ස්වරූපයන් මතුවුණා.

උදාහරණයක් විදිහට කියනව නම් ඇල්ජීරියාව, කෙන්යාව, වියට්නාමය, චීනය වගේ රටවලදි මේ නිදහස් සටන මතුවුණේ සන්නද්ධ අරගලයක ස්වරූපයෙන්. තවත් සමහර රටවලදි මෙය දැඩි සටන්කාමී රැඩිකල් ස්වරූපයකින් ඉස්මතු වුණා. ඉන්දියාව ඒ සඳහා හොඳම උදාහරණය. තවත් සමහර රටවල මේ සටනට මුලපිරුවෙ අධිරාජ්‍යවාදී පාලකයන් විසින් නිර්මාණය කරන ලද දේශීය ව්‍යාපාරික පැලැන්තිය. එම තත්වයට හොඳම උදාහරණය තමයි ශ්‍රී ලංකාව.

කෙසේ හෝ මේ සමස්ථ ක්‍රියාවලියෙ අවසන් ප්‍රතිඵලය වුණේ මෙම යටත්විජිතවලට නිදහස ලැබීම ආරම්භ වීම. හැබැයි මේ නිදහස ලැබීමත් සමඟ ම එම යටත්විජිතවලට විවිධ ප්‍රශ්න මතුවෙන්න පටන් ගත්ත. ඔවුන්ගෙ සමාජ ආර්ථික රටාව දියුණු කරගන්න අවශ්‍ය වුණා. ඒ වන විට ලෝකය ප්‍රධාන වශයෙන් කඳවුරු දෙකකට බෙදිල තිබුණා. ඒ තමා සමාජවාදී කඳවුර හා ධනවාදී කඳවුර. මේ කඳවුරු දෙකටම සම්බන්ධ නොවී තනිව ඉදිරියට යන්නේ කොහොමද කියන ප්‍රශ්නය බොහෝ රටවලට මතුවෙලා තිබුණා. අපි මේ කතාකරමින් ඉන්න අලුතින් නිදහස ලබපු රටවලට මේ ප්‍රශ්නය බෙහෙවින් බලපෑව. ඔවුන්ට ඕන වුණා. ඔවුන්ගෙ සමාජ ආර්ථික රටාවක් ඇතුළෙ ඉදිරියට යන්න.

මේ සඳහා විවධ උත්සාහයන් දියත් වුණා. 1947 දි ඉන්දියාවෙ ආසියා රාජ්‍ය නායකයින්ගෙ සමුළුවක් පැවැත්වුණා. 1952දිත් ඉන්දියාවෙ එවැනම සමුළුවක් පැවැත්වුණා. 1954 කොළඹ බලවතුන්ගෙ සමුළුව නමින් කොළඹදිත් සමුළුවක් පැවැත්වුණා. මේ හැම එකකම අරමුණ වුණේ අලුතින් නිදහස ලබපු රටවල් තමාගෙ සමාජ ආර්ථික වටපිටාව දියුණු කරගනිමින් ඉදිරියට යන්නෙ කොහොමද කියන එක පිළිබඳව තීරණයකට එළඹීමයි. මෙම සමුළුවල ඉතාම දියුණු අවස්ථාවක් තමයි 1955 දි ඉන්දුනීසියාවෙදි පැවැත්වෙන බන්දුන් සමුළුව. ඒ සඳහා ප්‍රධාන කඳවුරු දෙකට අයත් නොවූ බලවතුන් විශාල පිරිසක් එක්වෙනව. චීනයේ චෞ එන් ලායි, ඉන්දියාවේ ජවහල්ලාල් නේරු, ඉන්දුනීසියාවේ සුකර්නෝ ආදීන් ඉන් කීපදෙනෙක්. මොවුන් සියලු දෙනාගෙ උත්සාහය වන්නෙ අලුතින් නිදහස ලැබූ රටවල්වලට ප්‍රධාන කඳවුරු දෙකටම අතරමැද මාවතක් හරහා සංවර්ධනය ළඟා කරගැනීම.

මෙම උත්සාහයන්ගේ ප්‍රතිඵලයක් ලෙසින් 1961 කයිරෝ නගරයෙදි නොබැඳි ජාතීන්ගේ ආරම්භක සමුළුව පැවැත්වෙනව. එහිදී මෙම රටවල් තමන්ගෙ ආර්ථික දේශපාලන සමාජයීය දියුණුව උදෙසා එක ප්‍රතිපත්තියකට යොමු වෙනව. ප්‍රධාන කඳවුරු දෙකටම අයත් නොවී ස්වාධීනාව කටයුතු කරන්න රටවල් සිය ගණනක එකඟ වෙනව. තමතමන්ගෙ අයිතිවාසිකම් දිනා ගන්නට සාමූහිකව කැපවීමෙන් වැඩ කරන්න මෙම රටවල් එකඟ වෙනව. රටවල් සිය ගණනක් ඒ සඳහා සහභාගි වෙනව.

1960 සිට 1980 දශකයේ මැද භාගය වෙනකම්ම නොබැඳි ව්‍යාපාරය ඉතාමත් ශක්තිමත් ලෙස ප්‍රධාන බලකඳවුරු දෙකට ගැති නොවී මැද මාවතක ගමන් කරනව. රටවල් 116ක් එහි සාමාජිකත්වය ලබනව. ඔවුන්ට පුළුවන් වෙනව තමතමන්ගෙ ආර්ථික සමාජයීය අයිතිවාසිකම් රැසක් දිනාගන්න. එතෙක් නිදහස හිමි නොවී තිබූ අප්‍රිකානු රටවල් රැසකට නිදහස ලබා දෙන්නට ඔවුන්ට හැකි වෙනව. ඒ වගේම ලෝකයේ මතුවීමට එන රැටුම් රැසක් මර්ධනය කරන්නත් ඔවුන්ට හැකි වෙනව. බල කඳවුරුවල ක්‍රියාදාමයන්ට එරෙහිව පොදුවෙ සටන් කරල තමන්ගෙ අයිතිවාසිකම් දිනාගන්න ඔවුන්ට හැකි වෙනව. ඒ විතරක් නෙමෙයි තම තමන්ගෙ රටවල තිබෙන සිවිල් යුද්ධ, අරගල ආදියට පොදුවෙ විසඳුම් ලබා ගන්නත් ඔවුන්ට පුළුවන් වෙනව. මේ නිසා 60 දශකයේ ආරම්භයේ සිට 80 දශකයේ මැද වෙනකල් නොබැඳි ව්‍යාපාරය ලෝකය තුළ ඉහළ මට්ටමකින් පුළුල් ආකාරයකින් ක්‍රියාත්මක වුණා කියල හඳුන්වන්න පුළුවන්.

කෙසේ වෙතත් 80 දශකයේ මැද භාගයෙන් පස්සෙ ලෝකයේ බල කඳවුරු බිඳ වැටීමත් එක්ක නොබැඳි ව්‍යාපාරයට කරන්න පුළුවන් බලපෑම සීමාසහිත වෙනව. එය දුබල වී යනව. මෙයට හොඳම උදාහරණයක් තමයි 2003 මාර්තු මාසෙ ඇමෙරිකාව ඉරාකය ආක්‍රමණය කරන්න ඉස්සර වෙලා පෙබරවාරි මාසෙ මැලේසියාවේ ක්වාලාලම්පූර් නුවරදි නොබැඳි ජාතීන්ට අයත් රටවල් 116ම රැස් වෙනව. එහිදි ඔවුන් පොදු යෝජනාවක් සම්මත කරගන්නව ඉරාකයට පහර නොදෙන ලෙස ඇමෙරිකාවෙන් ඉල්ලා සිටීමට. එහෙත් ඔවුන්ගේ එම යෝජනාව ඇමෙරිකාව තුට්ටුවකටවත් මායිම් කරන්නෙ නෑ. මා මෙතනදි කියන්නෙ නෑ නොබැඳි ව්‍යාපාරය බලවත්ව තිබ්බ නම් මේ ආක්‍රමණය නවත්තන්න තිබුණා කියල. කොහොම වුණත් යම් බලපෑමක් කරන්න තිබුණා. ඒ බව පැහැදිළියි.

නොබැඳි ව්‍යාපාරය බලවත්ව තිබ්බ නම් ලෝකය තුළ පසුගිය කාලයේ සිදුවූ තවත් සිදුවීම් ගණනාවක් සිදුනොවෙන්න හරි එය අවම කරගන්න හරි ඉඩ තිබුණා කියල මම විශ්වාස කරනව. කොහොම වුණත් අවසානයෙ නොබැඳි ව්‍යාපාරය දුර්වල වුණා. නොබැඳි ව්‍යාපාරයට මුල් වුණු රටවල් ගණනාවක් විනාශ වුණා. එයට විවිධ හේතු තියෙනව. බටහිර බලවතුන්ගේ කුමන්ත්‍රණත් ඒ අතර නැහැ කියල කියන්න බෑ. නොබැඳි ව්‍යාපාරයේ මූලික රටක් වෙච්ච යුගෝස්ලෝවියාව අද වන විට ලෝක සිතියමේවත් නෑ. කුමන්ත්‍රණකාරී විදිහට එය ලෝක සිතියමෙන් අතුගා දැම්ම. ප්‍රශ්න තිබුණත් සදාම් හුසේන් කියන්නෙත් නොබැඳි ව්‍යාපාරය තුළ සිටිය කෙනෙක්. ඔහු දඩමීමා කරගෙන අද ඉරාකයත් විනාශයට යොමු වෙල. ඉන්දුනීසියාවට පවා අවාසනාවන්ත ඉරණමකට මුහුණ දෙන්න වෙලා තියෙනව. ඉරානය සිරියාව වගේ රටවලටත් ප්‍රශ්න මතුවෙලා. නොබැඳි ව්‍යාපාරය බලවත්ව තිබ්බ නම් මේ ප්‍රශ්න අවම කරගන්න තිබ්බ කියල මම විශ්වාස කරනව.

නොබැඳි ව්‍යාපාරය මේ විදිහට බිඳ වැටෙන්න තවත් මූලික වුණු හේතුවක් තමයි ඔවුන්ගේ පැවැත්මට යම් මට්ටමක සහයෝගයක් පළකළ සමාජවාදී කඳවුරේ බිඳවැටීම. සමාජවාදී කඳවුර නොබැඳි ව්‍යාපාරයට බාධා කළේ නෑ. යම් සහයෝගයක් ලබාදුන්න. ධනවාදී කඳවුර එළිපිට නොබැඳි ව්‍යාපාරයට විරුද්ධ වුණේ නෑ. එයට අභියෝග කළේ නෑ. ඒත් සමාජවාදී බිඳවැටීමත් සමඟ නොබැඳි ව්‍යාපාරය තනිවෙලා බිඳ වැටිල ගියා.

කොහොම වුණත් අද වන කොට ලෝකයේ බල කඳවුරු ඉතිරි වෙලා නෑ. අද බල කඳවුරු වෙනුවට නිර්මාණය වෙලා තියෙන්නෙ බල කේන්ද්‍ර. ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය, චීනය, ඉන්දියාව යන රටවල් යුධමය, ආර්ථිකමය, සමාජමය වශයෙන් විවිධ බල් කේන්ද්‍ර නිර්මාණය කරගෙන තියෙනව. මේ බල කේන්ද්‍ර හමුවේ

23 පිටුවට